# ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග

(බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති සම්මන්ත්‍රණය)

2016 - 07 -22



BKT- 0081
25.08.2023



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

16 DEC 2019

# ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග

(බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති සම්මන්ත්‍රණය)

2016 - 07 - 22

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

1-CM24082

155



# ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග

(බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති සම්මන්ත්‍රණය අමතා ජනාධිපතිතුමා දැක්වූ අදහස් 2016-07-22)

මම ඉතාමත් සතුටු වෙනවා, අපේ රට ඉදිරියේ ඇති සංවර්ධන අභියෝග පිළිබඳව සාකච්ඡා කිරීමේ මෙම වැඩසටහන සාර්ථක කරමින් ඔබ සමග එක්වීමට ලැබීම පිළිබඳව. මා තුළ මතු වූ මේ අදහස ඉතා සාර්ථක සම්මන්ත්‍රණයක් දක්වා සංවිධානය කිරීම පිළිබඳව මගේ නිලධාරි මහත්වරුන්ට මම ස්තුතිවන්ත වෙනවා.

වර්තමාන ආණ්ඩුව බලයට පත්වී ගෙවුණු වසර එකහමාරකට වැඩි කාල සීමාව තුළ රටේ කතාබහට ලක් වූ ප්‍රධාන විෂයන් දෙකක් මෙම වැඩසටහනේ දේශන සඳහා සුදුසුයි කියලා මම තීරණය කළා. ඒ අනුව මහ බැංකු අධිපති ආචාර්ය කුමාරස්වාමි මහතාත්, ඒ වගේම නීතිපති ජයන්ත ජයසූරිය මහතාත් මෙම දේශන සඳහා සුදුසු බව මා තීරණය කළා.

සංවර්ධන අභියෝග පිළිබඳව මහ බැංකු අධිපතිතුමා සඳහන් කළ කරුණු තුළ රටේ වර්තමාන ආර්ථිකයත්, එහි තිබෙන ගැටලුත්, එයින් ගොඩ ඒම සඳහා අප විසින් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳවත් ඉතා සංක්ෂිප්තව කරුණු ඉදිරිපත් කෙරුණා. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම එතුමා යෝජනා කළා නව සංවර්ධන රාමුවක් පිළිබඳව.

ආර්ථික වශයෙන් මේ තත්ත්වයට රට පත්වීමට හේතුවූයේ ඇයි කියන කරුණු පිළිබඳව පසුවිපරම් කිරීම සහ අධ්‍යයනය කිරීම අවශ්‍ය වුවත් අද තිබෙන තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා අපේ වගකීම් ඉටු කිරීමේදී ඒ පිළිබඳව කෙනෙකුට චෝදනා කිරීම හෝ ඇඟිල්ල දිගු කිරීම වෙනුවට අප විසින් කළ යුත්තේ අප භාරගත් වැඩ කොටස නිසි ලෙස ඉටු කරමින් රට සහ රටේ ජනතාව වෙනුවෙන්, අනාගත ජයග්‍රහණ වෙනුවෙන් අපේ වගකීම් සහ යුතුකම් ඉටුකිරීම බවයි මම විශ්වාස කරන්නේ.

ඒ වගේම නීතිය ක්‍රියාත්මක වීමේදී දේශපාලන පළිගැනීම් සිදුවනවා කියන

චෝදනාව එක් පැත්තකින් රජයටත්, තවත් පැත්තකින් පෞද්ගලිකවත් එල්ලවන කාලයක නීතිය සම්බන්ධයෙන් විශේෂයෙන්ම සදාචාරාත්මක සමාජයක් සඳහා අපේ පෙළගැස්ම, හැඩගැස්ම හා ගමන් මග කෙසේ විය යුතු ද යන්න පිළිබඳව නීතිපතිතුමා ඉදිරිපත් කළ දේශනය පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

## යහ පාලන සංස්කෘති

2015 ජනවාරි 8 වනදා ජයග්‍රහණය කළ මැතිවරණ ප්‍රකාශනයෙන් අප යහපාලන සංකල්පය ඉදිරිපත් කළා. **යහපාලන සංකල්පය අපේ ආණ්ඩුවට හෝ රටට අලුත් දෙයක්** නොවන බව තමුන්නාන්සේලා දන්නවා.

ලෝක ඉතිහාසයේ විවිධ තැන්වලදීත් අපේ අසල්වැසි මහා භාරතයේ ලිච්ඡවී රජ දරුවන්ගේ, අශෝක අධිරාජයාගේ පාලන කාලයේදී සේම අපේ අනුරාධපුර, පොළොන්නරු යුගවල සිට විවිධ අවස්ථාවල යහපාලන සංකල්ප ක්‍රියාත්මක වූ ආකාරය ඉතිහාස පොත පතේ සඳහන් වෙනවා.

වර්තමාන ආණ්ඩුව බිහි කිරීමේදී 2015 ජනාධිපතිවරණයේ මැතිවරණ ප්‍රකාශනය තුළ මේ යහපාලන සංකල්පයට **ප්‍රමුඛත්වයක් දීමට සිදුවුණේ යහපාලන සංකල්පය පිළිබඳ කාගේත් දැනුමක් අවබෝධයක් තිබුණත් එයට අපේ රටේ හැඩගැසීමක්** නොතිබූ නිසයි. බොහෝ වෙලාවට ආර්ථිකය පිළිබඳ කතා කිරීමේදීත්, රටක් විදියට ඉදිරියට යාමේදීත් අප සියලුදෙනා විසින් ඉටුකළ යුතු වගකීම් සහ යුතුකම් පිළිබඳව අප කාටත් අවබෝධයක් තිබෙනවා.

අපේ රටේ රාජ්‍ය නිලධාරීන් විදියට, රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විදියට ඔබ මේ ශාලාව තුළ නියෝජනය වුණත් ඔබ නියෝජනය කරන්නේ ලක්ෂ 13 කට වැඩි සමස්ත රාජ්‍ය සේවයයි. ආණ්ඩුවේ කටයුතු කරගෙන යාමේදී බොහෝ වෙලාවට මතුව ඇති ප්‍රශ්න හා ගැටලු අතීතයේ ආණ්ඩු තුළත් මගේ අත්දැකීමෙන් මම දැකලා තිබෙනවා. මේ රටේ රාජ්‍ය සේවයේ පහළම තැන සිට මෙතනට පැමිණි කෙනෙක් විදියටත්, ඒ වගේම වසර 45 කට වැඩි කාලයක් රාජ්‍ය සේවයේ විවිධ ක්ෂේත්‍රවල විවිධ තනතුරු දරන අය ඉතා සුහදතාවයෙන් සහ මිත්‍රශීලිව ඇසුරු කළ කෙනෙක් විදියටත් **මේ රටේ රාජ්‍ය සේවාවේ කටයුතු කරන සෑම කෙනෙකුගේම සිතුම් පැතුම් අදහස්, සංකල්ප ඔවුන් මුහුණදෙන ප්‍රශ්න සහ ගැටලු පිළිබඳව මට හොඳ අවබෝධක් තිබෙනවා.**

## රාජ්‍ය සේවයේ ඵලදායකත්වය

අද ඇතැම් වෙලාවට රාජ්‍ය සේවයේ කටයුතු කරන විට තීන්දු තීරණ ගැනීම පිළිබඳව ප්‍රශ්න මතුවී තිබෙනවා. කාර්යක්ෂමතාව පිළිබඳව ප්‍රශ්න තිබෙනවා. අපේ රාජ්‍ය සේවයේ ඵලදායිතාවය පිළිබඳව මහ බැංකු අධිපතිතුමාගේ දේශනයේදී සඳහන් කළා. මම හිතන්නේ ඔබ අප කවුරුත් පිළිගන්නවා අපේ රාජ්‍ය සේවයේ ඵලදායීතාවය පිළිබඳව අපි ඉන්නේ සතුටු විය හැකි තැනක නොවේ කියන එක. එය මේ අපේ ආණ්ඩු කාල සීමාවේ පමණක් නොවෙයි පසුගිය දශක කිහිපයම ගත්තොත් රාජ්‍ය සේවයේ ඵලදායීතාවය සම්බන්ධනේ රටක් විදියට, ආණ්ඩුවක් විදියට සතුටු විය හැකි තැනක අප සිටියේ නැහැ.

එහෙමනම් රාජ්‍ය සේවයේ ඵලදායීතාවය අඩු වශයෙන් සියයට පනහක් ඉක්මවීම සඳහා අපි කටයුතු කිරීම අවශ්‍යයි. **මේ වන විට සියයට විසි පහක, තිහක වගේ තිබෙන ඵලදායීතාවය සියයට පනහ ඉක්මවීම අපේ ඉලක්කය නම් ඒ සඳහා ඔබ අප සූදානම් විය යුතුයි කියන එකයි මම විශ්වාස කරන්නේ.** ඒ ඉලක්කය කරා ළඟාවීමේදී ඔබ මුහුණදෙන ගැටලු සහ ප්‍රශ්න මොනවාද, මේ පැවසූ තත්ත්වයන් ළඟා කර ගැනීම සඳහා ගමන් කිරීමේදී අප මුහුණ දෙන ප්‍රශ්න මොනවාද, යන්න සොයා බැලීම අත්‍යවශ්‍ය වෙනවා.

## ශිෂ්ටත්වය විනය සහ හෘද සාක්ෂිය

එක් පැත්තකින් පුරවැසියෙක් විදියට, තවත් පැත්තකින් රටේ ජනතාවගේ ප්‍රධාන සේවකයා විදියට මම නම් දකින්නේ සියලු අංශවල තිබිය යුතු ශිෂ්ටත්වය සහ විනය පිළිබඳ ප්‍රශ්නයයි.

දේශපාලනඥයින්, රාජ්‍ය නිලධාරීන්, රටේ සමස්ත පුරවැසියන් අද තිබෙන තත්ත්වයෙන් **රට ගොඩ ගැනීම සඳහා ශිෂ්ට සම්පන්න බව සහ විනය පිළිබඳව තම චින්තනයෙන් සහ සිතුම් පැතුම්වලින් තමාගේ හෘද සාක්ෂියට එකඟව තීන්දු කරලා කටයුතු කිරීම අවශ්‍යයි කියා මා විශ්වාස කරනවා.**

මම රාජ්‍ය නායකයා විදියට, ජනාධිපතිවරයා විදියට මම වැරදි කරනවා නම් ඒ වැරදි බරපතළ ද, සුළුකොට තැකිය හැකි ඒවාද කියන එක නෙවෙයි

2-CM24082

ප්‍රශ්නය, මා දැනුවත්ව මා අතින් වැරදි සිදුවෙනවා නම්, මගේ ඇමති මණ්ඩලය වැරදි කරන විට මට ඔවුන්ට ඇඟිල්ල දිගු කරන්න පුළුවන්කමක් නැහැ. මම හෝ මගේ ඇමති මණ්ඩලය සිතා මතා සැලසුම් කරමින් තීන්දු තීරණ ගෙන දූෂණ, අක්‍රමිකතා සිදු කරනවා නම් පහළ දෙපාර්තමේන්තු, ආයතනවල සිටින රාජ්‍ය නිලධාරීන් වංචා දූෂණ අක්‍රමිකතා සිදු කළහොත් ඔවුන්ට ඇඟිල්ල දිගු කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වගේම දේශපාලනඥයින් සහ රාජ්‍ය නිලධාරීන් සිය විනය, ශිෂ්ටත්වය සහ හැදිච්චිකම අමතක කර වැරදි කරනවා නම් රටේ සාමාන්‍ය පොදු ජනතාව තුළින් සිදුවන වැරදි පිළිබඳව පුදුම වෙන්න දෙයක් නැහැ.

ඒ නිසා මම විශ්වාස කරනවා විනය, ශිෂ්ටත්වය සහ හැදිච්චිකම පිළිබඳව, යහපාලන සංකල්පය පිළිබඳව, නීතිය රැකීම පිළිබඳව. නීතිය සුරක්ෂිත කිරීම සහ පෝෂණය කිරීම පිළිබඳව මේ කියන කරුණු ඉටුකර ගැනීම සඳහා අනාගතයේ වඩා සුබවාදී, සමෘද්ධිමත් මාතෘ භූමියක් ගොඩනැගීම පිළිබඳව මූලික ආදර්ශය දිය යුත්තේ දේශපාලනඥයින් කියලා.

## රාජ්‍ය සේවක අයිතිවාසිකම්

ඉන් පසුව එතනින් පහළට ගලා යන රාජ්‍ය සේවයේ විධායක නිලධාරීන්, මාණ්ඩලික නිලධාරීන්, රාජ්‍ය සේවකයින් ගත්විට මා විශ්වාස කරනවා අද දවස ගත්තත්, මීට පෙර රජයන් ගත්තත් අපේ රාජ්‍ය නිලධාරීන්ට තමා මුහුණදෙන ප්‍රශ්න සහ ගැටලු පිළිබඳව ඒවා ඉදිරිපත් කිරීම සහ විසඳුම් ලබා ගැනීම සම්බන්ධයෙන්, තම ආරක්ෂාව සම්බන්ධයෙන් බොහෝ වෙලාවට ප්‍රශ්න ඇතිවෙනවා කියලා. මාණ්ඩලික සහ විධායක නොවන ශ්‍රේණිවලට අයත් රාජ්‍ය සේවකයින් වශයෙන් හඳුන්වන පිරිස් ඉන්නවා. බොහෝ වෙලාවට සිය වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීම් තිබෙනවා. සත්‍යග්‍රහ, උපවාස, උද්ඝෝෂණ, ආයතන ප්‍රධානීන්ට දැනුම්දීම්, දේශපාලනඥයින්ට දැනුම්දීම් කරනවා. රාජ්‍ය සේවකයා සතුව එම හැකියාව අයිතීන් සහ වරප්‍රසාද ඉතා පහසුවෙන් මේ රටේ ලැබී තිබෙනවා නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් හැටියට.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## දුක්ගන්නා රාළ කෙනෙක්

එහෙත් මාණ්ඩලික නිලධාරින්ට සහ විධායක නිලධාරින්ට ඇතිවන ගැටලු සහ ප්‍රශ්නවලදී තමන්ගේ දුක් ගැනවිලි ඉදිරිපත් කරන්න තමා ගන්නා නිවැරදි තීන්දුවලදී ඇතිවන ප්‍රශ්න කියන්න, අසන්න **දුක්ගන්නා රාළ කෙනෙකුගේ** අඩුවක් මම දකිනවා. මේ වසර එකා හමාරක කාලය තුළ මගේ අත්දැකීමත්, රාජ්‍ය සේවයේ ප්‍රධානීන් ඔවුන් මුහුණදෙන ප්‍රශ්න පිළිබඳව මා හමුවී සාකච්ඡා කිරීමේදීත් ඉදිරිපත් වූ කරුණු පිළිබඳව මට අවබෝධයක් තිබෙනවා.

නීතිපතිතුමාගේ දේශනයේදී සඳහන් කළා රජයේ නිලධාරීන් වැරදිවලට හසුවීම පිළිබඳව නීතියේ තිබෙන පසුබිම පිළිබඳව. එහිදී මා දැනුවත් වූ ආකාරයට යම් රාජ්‍ය නිලධාරියෙකුට මරණීය තර්ජන එන තත්ත්වයකට යම් බලපෑමක් කළහොත්, ඔහු අතින් එම බලපෑම් මත වැරැද්දක් වුවහොත්, ඔප්පු කළහොත් මරණීය තර්ජනය දක්වා මට බලපෑමක් ආවා කියලා ඒ රාජ්‍ය නිලධාරියාට යම් සහනයක් තිබෙනවා.

## රාජ්‍ය නිලධාරීන් සහ පීඩනය

ඇතැම් වෙලාවට රාජ්‍ය නිලධාරින්ට මරණීය තර්ජන එන අවස්ථාවන් පිළිබඳව අපි අහලත් තිබෙනවා, දැකලත් තිබෙනවා, එවැනි දේවල් සිදුවෙලත් තිබෙනවා අපේ රටේ පසුගිය දශක කිහිපයේ සෑම ආණ්ඩුවක් යටතේම.

නමුත් ඊට මෙපිට වන තර්ජනවලදී මේ අසරණ රාජ්‍ය නිලධාරීන් කල්පනා කරනවා මම මගේ පුටුව කොහොමද රැක ගන්නේ, මගේ තනතුර කොහොමද රැක ගන්නේ, **මගේ රැකියාව කොහොමද රැක ගන්නේ, ඒ නිසා** මේක කොහොමහරි කරලා දාන්න ඕන කියලා. ඇතැම් වෙලාවට එම අදහස තුළ **ඇතැම් නීති විරෝධී කටයුතු වෙනුවෙන් සමහර රාජ්‍ය නිලධාරීන් තීන්දු තීරණ ගන්නවා.** එහෙමනම් මේ රාජ්‍ය අංශයේ සිටින සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට තමන්ට ඇතිවන ගැටලු සහ ප්‍රශ්න බලපෑම්, තමන් සාධාරණ හා නීත්‍යානුකූලව කටයුතු කරන විට එයින් බැහැරවීමට කරන බලපෑම්, සමහරවිට නීති විරෝධී ලෙස ටෙන්ඩර් සඳහා කරන බලපෑම්, මිලදී ගැනීම්වලදී යම් යම් තෝරා ගැනීම් එවැනි දේ පිළිබඳ බලපෑම් එනවනම් ප්‍රශ්න එනවනම් මේ කියන ඉලක්ක සම්පූර්ණ කර ගන්න පුළුවන්කමක් නැහැ.

## තෘප්තිමත් හා නිදහස් පරිසරයක්

රාජ්‍ය නිලධාරීන්ට තෘප්තිමත් මනසකින්, නිදහස් මනසකින් වැඩකරමින් තමාගේ වගකීම් සහ යුතුකම් ඉටු කිරීම සඳහා නිදහස් පසුබිමක් සහ පරිසරයක් අවශ්‍ය වෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වෙනවා අගමැතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය සමග සාකච්ඡා කරලා රාජ්‍ය නිලධාරීන්ට ඇතිවන බලපෑම්, ප්‍රශ්න, දුක්ගැනවිලි සම්බන්ධයෙන් ඉදිරිපත් කළ විට ඒ සම්බන්ධයෙන් ඉතාම **අපක්ෂපාතීව, මධ්‍යස්ථව, ස්වාධීනව කටයුතු කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහයක්** සැකසීමට. මා හිතනවා ඒ ආරක්ෂාව නිලධාරීන්ට වැඩ කිරීමේදී අවශ්‍යයි කියලා.

## බලය වෙනුවට හෘද සාක්ෂිය

මම බලය සඳහා එල්බ සිටින කෙනෙක් නෙවේ. ඒ වගේම කිවයුතු දේ පිළිබඳව, කීමට අවශ්‍ය දේ පිළිබඳව පසුබට වෙන්නෙත් නැහැ. යහපාලන නාම පුවරුව එක්ක කවුරු හරි වැරදි කරනවා නම් ඒ වැරැද්දට ඉඩ දෙන්න මම ලෑස්ති නැහැ. මම ඒක බොහොම පැහැදිලිව කියන්න ඕන. ඒ නිසා යහපාලන, යහපාලන, **යහපාලන කියලා යහපාලනය අස්සේ අයහපත් පාලනයකට ඉඩ තබන්න පුළුවන්කමක් නැහැ.** හැම කෙනෙක්ම තමන්ගේ හෘද සාක්ෂියට එකඟව කටයුතු කිරීම අවශ්‍ය වෙනවා. එහෙම නැත්නම් රටේ ජනතාව අප කෙරෙහි තැබූ බලාපොරොත්තු සුන් වෙනවා.

## කෘෂිකර්මය

ආර්ථිකය සම්බන්ධයෙන් තිබෙන තත්තවයේ දී මහ බැංකු අධිපතිතුමා බොහොම පැහැදිලිව සඳහන් කළා අපේ අපනයන ආදායම සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය පිළිබඳව. දේශීය කර්මාන්ත කඩා වැටීම එයට ප්‍රධාන හේතුවක්. එතුමාගේ දේශනයේ දී සඳහන් කළා කෘෂි කර්මාන්තයේ ඇති අඩුපාඩු පිළිබඳව වගේම රටේ සහල් අතිරික්තයක් පිළිබඳවත්. මේ සහල් අතිරික්තය පිළිබඳ කාරණයේ දී මම පෞද්ගලිකව දරන මතය තමයි මහ බැංකු අධිපතිතුමනි, 2014 වසර ගත්තොත් පාන් පිටි මෙට්‍රික් ටොන් දශ ලක්ෂයකට කිට්ටු වෙන්න රටේ ජනතාව පරිභෝජනය කර තිබෙනවා. අවුරුද්දකට පාන් පිටි මෙට්‍රික් ටොන් දශ ලක්ෂයක් මේ රටේ පරිභෝජනය කරනවනම්, එයින් භාගයක්වත් අඩු කරගන්න පුළුවන්නම් සහල් අතිරික්තයක්

නැහැයි කියලයි මම විශ්වාස කරන්නේ. පාන් පිටි පරිභෝජනය පිළිබඳ තිබෙන සෞඛ්‍යමය තත්ත්වය පිළිබඳ මම කතා කරන්නේ නැහැ.

**නමුත් දේශීය කෘෂිකර්මාන්තය දියුණු කිරීමේදී අපිට තිබෙන අභියෝග අතරේ විශේෂයෙන්ම ජනතාවගේ පාරිභෝජනය පිළිබඳව නව සංස්කෘතියක අවශ්‍යතාවය මම දකිනවා.** දේශීය කර්මාන්ත ඇද වැටීම තුළ ප්‍රධාන වශයෙන්ම අපේ අපනයන වෙළෙඳපොළ දුර්වලවීමේ තත්ත්වය තුළ විදේශ වත්කම් පහළ වැටීමත්, ආනයන, අපනයන පරතරය වැඩිවීමත් කියන අභියෝග ජය ගනිමින් අපේ රට ගොඩගන්න අපි සෑම කෙනෙක්ම කටයුතු කිරීම අවශ්‍ය වෙනවා.

## එෆ්. සී. අයි. ඩී. භීතිකාව

පසුගිය දිනවල ඇහුණු දේවල් අතරේ FCID භීතිකාව ප්‍රධාන තැනක් ගන්නවා. මේක නිලධාරීන් විතරක් නෙවේ මම අහගෙන ඉඳලා තියෙනවා ඇතැම් ඇමතිවරුත් පාවිච්චි කරනවා. සමහර ඇමතිවරු කියනවා අපිට FCID යන්න වෙයි කියලා. සමහර නිලධාරි මහත්තුරු කියනවා අපිට FCID යන්න වෙයි කියලා. ඒ වගේම අපිට තොරතුරු ලැබෙනවා සමහර අංශවල තීන්දු තීරණ ගැනීම සම්බන්ධයෙන් තිබෙන පසුබෑම පිළිබඳ සොයා බැලීමේදී FCID භීතිකාව ඊට හේතු වී ඇති බව.

ඇයි මේ FCID ක් මේ රටට නිර්මාණය වුණේ, ඇයි එවැනි ආයතනයක් හදන්න වුවමනා වුණේ මගේ මැතිවරණ ප්‍රකාශනයේ බොහොම පැහැදිලිව රටේ සිදුවන වංචා දූෂණ අවම කිරීම සඳහා අවශ්‍ය නව ආයතන පිහිටුවීමත්, අල්ලස් හා දූෂණ කොමිසම ශක්තිමත් කිරීමත්, ඒ වගේම **රාජ්‍ය සේවයේ සියලු දෙනාට කොන්ද කෙළින් තබාගෙන වැඩ කිරීම වෙනුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇතුළු ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීමත්** කියන කරුණු ප්‍රධාන පොරොන්දු වශයෙන් සඳහන් වෙනවා. 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් මේ පොරොන්දු ඉටුකිරීමට අපි සමත් වුණා.

## ස්වාධීන කොමිෂන් සභා ගොඩනැගීම

ස්වාධීන කොමිෂන් සභා තවම ඉන්නේ අලුත් ප්‍රවේශයක. භෞතික සම්පත් අඩු පාඩු තිබෙනවා, මානව සම්පත් අඩු පාඩු තිබෙනවා කොමිෂන් සභාවල කෙරෙන කාර්යයන්වල සීමාව පිළිබඳවත් ප්‍රශ්න තිබෙනවා. අමාත්‍යාංශවලින් නොයෙකුත් ප්‍රශ්න ඉදිරිපත් කරනවා කොමිෂන් සභා එක්ක වැඩ කිරීමේදී ඇතිවෙන ගැටලු. අපේ රජය පැත්තෙන් අඩු පාඩුවක් වෙලා තිබෙනවා **ස්වාධීන කොමිෂන් සභාවල සීමාව තුමක්ද යන්න පිළිබඳව නිශ්චිතව දක්වා නොමැතිකම සහ ඔවුන්ගේ කාර්ය පටිපාටිය සහ බලතල සම්බන්ධ ව්‍යුහයක් පැහැදිලිව සඳහන් නොකිරීම.** ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා පාර්ලිමේන්තුවත්, ව්‍යවස්ථාදායක සභාවත් සමග සාකච්ඡා කරලා ස්වාධීන කොමිෂන් සභාවල කාර්ය පටිපාටිය, සීමාව කොතනද කියන කාරණාව තීන්දු කරලා ඒ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

## ලැජ්ජා භය පිළිබඳ ආකල්පය

ඒ නිසා මෙවැනි ආයතන ඇති වුණේ රට තුළ එදා තිබුණු අයහපත් තත්ත්වයත් එක්ක කොතනින් හෝ මේවා නැවතීම අවශ්‍ය නිසා. දැන් දේශපාලනඥයොත් පාවිච්චි කරනවානම් අපිට FCID යන්න වෙයි කියලා දේශපාලනඥයෝ තුළත් බයක් හා ලැජ්ජාවක් ඇතිවෙලා තිබෙනවා. මේක රටකට අවශ්‍යයි. **භය සහ ලැජ්ජාව නැත්නම් මිනිහෙක් සතෙක් වගේ තමයි හැසිරෙන්නේ කියලා තමුන්නාන්සේලා අපි අහලා තිබෙනවා.** නිලධාරි මහත්තුරු කියනවනම් අපිට FCID යන්න වෙයි කියලා දූෂණය, වංචාව, හොරකම පිළිබඳව ඒගොල්ලන්ටත් බයක් ඇතිවෙලා තිබෙනවා. එහෙම වුණේ සම්පූර්ණයෙන්ම මේවාට විවෘත වූ සමාජයක් තිබුණා, ඒ නිසා ඒ සමාජය වෙනස් කිරීමේ අවශ්‍යතාවය ඇතිවුණා. ඒ සමාජයට තිත තැබීමේ අවශ්‍යතාවය ඇතිවුණා. ඒ නිසා අපි ස්වාධීන කොමිෂන් සභා හැදුවා. නීතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් FCID වැනි ආයතන හැදුවා. ඒ පිළිබඳ රටට නව සංකල්පයක් දුන්නා. ඇතැම් වෙලාවට රජය පිළිබඳ ඇතැම් අය බොහෝ උපහාසාත්මකව කතා කරනවා. මේ යහපාලන ආණ්ඩුව කියලා කොහේ හරි දෙයක් අල්ලලා මේ යහපාලන ආණ්ඩුවේ හැටි මෙහෙම තමයි කියලා කියනවා.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය


නමුත් මේ යහපාලන සංකල්පය, ඒ වගේම සංහිඳියා සංකල්පය අවතක්සේරු කරලා මේ රට ගොඩනගන්න පුළුවන්කමක් නැහැ. රටේ නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි කරන්න, රටේ ආදායම වැඩි කරන්න, විදේශ වත්කම් වැඩි කරන්න, ආනයන අපනයන පරතරය අවම කරන්න මේ සියල්ල සඳහා රාජ්‍ය ආදායම වැඩි කරන්න නම් අපි හැම කෙනෙක්ම දේශපාලනඥයා ද, රාජ්‍ය නිලධාරීන් ද අවංකව කැපකිරීමෙන් වැඩ කිරීම අවශ්‍ය වෙනවා.

## සමෘද්ධිමත් හා විනයගරුක රටක් ගොඩනගමු

ආණ්ඩුව මෛත්‍රීපාල සිරිසේනගේ ද, රනිල් වික්‍රමසිංහගේ ද එහෙම නැත්නම් තවත් කෙනෙකුගේ ද කියන ප්‍රශ්නය වැදගත් නැහැ. මහ බැංකු අධිපතිතුමා ඉදිරිපත් කළ දේශනයේ තිබෙන කරුණු ගත්තහම **හෙට දවසේ උපදින දරුවන් සඳහා සමෘද්ධිමත් රටක්, විනයගරුක රටක් හදන්න අපි හැම කෙනෙක්ම අපේ වගකීම ඉෂ්ට කරනවාද කියන ප්‍රශ්නයයි මා ඔබේ හෘද සාක්ෂියෙන් අහන්නේ.** ඒ නිසා ඒක මගේ හෝ ඇමති මණ්ඩලයේ පරම්පරාව පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. එය ඔබේ අනාගත පරම්පරාව පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නොවේ. මේ සමස්ත ජාතියේ අනාගතය සඳහා මේ රට ආර්ථික වශයෙන් ගොඩනගන්න, මේ රටේ විනයගරුක ශිෂ්ට සම්පන්න සමාජයක් හදන්න අපි සියලුදෙනාම සාමුහිකත්වයෙන් එකට වැඩ කිරීම අවශ්‍යයි කියන එක අපි කවුරුත් පිළිගන්න ඕන.

ඒ නිසා අපි දැඩි මිත්‍රශීලිභාවයකින්, සුහදතාවයකින්, සහෝදරත්වයකින් කටයුතු කළ යුතුයි. දේශපාලනඥයින් එක පැත්තක, රාජ්‍ය නිලධාරීන් තව පැත්තක, රටේ පුරවැසියන් තව පැත්තක විදියට ත්‍රිකෝණාකාරව නෙවෙයි අපි සියලුදෙනාම සාමුහික වගකීම තුළ රටේ පොදු මහජනතාව වෙනුවෙන් අපේ වගකීම සහ යුතුකම් දැඩි මිත්‍රශීලිභාවයකින් සහ සහෝදරත්වකින් ඉටු කරමුයි කියලා මම ඔබ සියලුදෙනාට ගෞරවයෙන් ආයාචනා කරනවා.

## ප්‍රගති සමාලෝචනයක්

අපේ දේශපාලනඥයින්ගේ තිබෙන අඩු පාඩුකම් නිසා ඇතැම් වෙලාවට දිස්ත්‍රික් සංවර්ධන සභාව කලට වෙලාවට රැස්වෙන්නේ නැහැ. මම දන්නවා දිසාලේකම්වරු දිනයක් ගන්න කොච්චර කරදර වෙනවද කියලා. අපේ ඇමතිවරුන්ගේ අඩුපාඩුකම් නිසා අමාත්‍යාංශවල මාසික ප්‍රගති සමාලෝචන

රැස්වීම තියන්නේ නැහැ. සමහර අමාත්‍යාංශ තියෙනවා අවුරුද්දට එක ප්‍රගති සමාලෝචන රැස්වීමක් තියලා නැහැ. සමහර දෙපාර්තමේන්තු තියෙනවා වාර්ෂිකව එක ප්‍රගති සමාලෝචන රැස්වීමක් තියන්නේ නැහැ. ඒ නිසා අගමැතිතුමත්, මමත් සාකච්ඡා කරලා අපි තීන්දු කළා අපි සෑම මාසයකම තමුන්නාන්සෙලාට එවනවා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට නිශ්චිත දිනයක්. පාර්ලිමේන්තුව රැස් නොවන සතිවල මාසයේ පළමුවෙනි සඳුදා හෝ දෙවැනි සඳුදා ඒ විදියට.

දිස්ත්‍රික් සංවර්ධන කමිටුව, දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව, ප්‍රාදේශීය සංවර්ධන කමිටුව සඳහා අපි වාර්ෂික කාල සටහනක් එවන්න බලාපොරොත්තු වෙනවා ඒ අනුව කටයුතු කරන්න. එවිට අපේ නිලධාරීන් අපහසුතාවයට පත්වෙන්නේ නැහැ. එන කෙනෙක් එක්ක රැස්වීම තියන්න පුළුවන්.

ඇමතිවරුන්ගෙන් දින ලබා ගැනීමේදී දිසා ලේකම්තුමාලා, ප්‍රාදේශීය ලේකම්තුමාලා බරපතල ප්‍රශ්නවලට මුහුණදීලා තිබෙනවා, මේ සම්මුතිවාදී ආණ්ඩුවේ ඒ මූලික හරය නිසියාකාරව තේරුම් නොගෙන ඇතැම් දේශපාලනඥයින් වැඩ කිරීම නිසා. ඒ නිසා රාජ්‍ය නිලධාරීන් අපහසුතාවට පත් කිරීම අවශ්‍ය වෙන්නේ නැහැ වගකීම් දරන මැති ඇමතිතුමාලා තම කාර්යය හරියට ඉෂ්ට කරනවනම්.


දැන් මේ වසරෙන් මාස 06 ක් ගිහිල්ලා මූල්‍ය ප්‍රගතිය, භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් මම මෙතන ඉන්න ඔබෙන් අහනවා ඔබේ ආයතනවල කී දෙනෙක් මේ දවස්වල මේ පිළිබඳ කටයුතු කළාද කියලා. මම දන්නවා ඇතැම් ආයතනවල මේවා කෙරෙන්නේ නැහැ. එහෙමනම් ඉලක්ක සහගත වැඩපිළිවෙළකට අපි කොහොමද යන්නේ.

දැන් මුදල් ඇමතිතුමා වාර්ෂික අය වැය ඉදිරිපත් කරලා මේක, සීරෝ බජට්, කියලා දැම්මා. එහෙමනම් දෙසැම්බර් 31 වෙනකොට සල්ලි කොහෙවත් තියෙන්න පුළුවන්කමක් නැහැ, ඔක්කොම භාණ්ඩාගාරයට යනවා. අපි වාර්ෂික ඉලක්ක සම්පූර්ණ කළේ නැත්නම්.

ඒ නිසා මහ බැංකු අධිපතිතුමත්, නීතිපතිතුමත් මේ කියපු කරුණු අනුව මේ රට ඉදිරියට ගෙන යන්න මේ අපේ ආයතනික ව්‍යුහය තුළ තිබිය යුතු කාර්යක්ෂමතාව සහ විධිමත් භාවය, ඉලක්ක සහගතව වැඩ කිරීම,

කැපවීමෙන් වැඩ කිරීම, චක්‍රලේඛ උපදෙස් පත්‍රිකාව වගේම ඉන් බාහිරව මේක අපේ වැඩක්, තමන්ගේ වැඩක්, **රටේ වැඩක්, ජනතාවගේ වැඩක් කියලා නිර්මාණශීලිව කළයුතු කාර්යයන් වගකීම් ලෙස වගේම යුතුකම් ලෙස ඉෂ්ට කිරීමත් ඔබ අප සියලුදෙනාම ඉතා සුහදතාවයෙන් සහ සහෝදරත්වයෙන් කටයුතු කිරීම අවශ්‍යයි කියලා මම විශ්වාස කරනවා.**

විශේෂයෙන්ම මේ කටයුතු සංවිධානය කළ ජනාධිපති ලේකම් පී. බී. අබේකෝන් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, දේශන සඳහා පැමිණි මහබැංකු අධිපතිතුමාට සහ නීතිපතිතුමාටත් සහභාගීවන සියලු මැති ඇමතිවරු, ආයතන ප්‍රධානින්, ත්‍රිවිධ හමුදා ප්‍රධානින්, පොලිස්පතිතුමා ඇතුළු සහභාගී වූ සියලුදෙනාට මගේ ස්තුතිය පුද කරනවා.



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග මැයෙන්
බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති සම්මන්ත්‍රණය
අමතා මහ බැංකු අධිපතිවරයා කළ කතාව
(2016-07-22)

## රටේ ආර්ථිකය හමුවේ ඇති අභියෝග

වසර ගණනාවකට පසු යළි රාජ්‍ය සේවයට පිවිසීමට අවස්ථාව ලැබීම සතුටට හේතුවක්. අද මගේ කාර්යභාරය අර්ථිකය ඉදිරියේ ඇති අභියෝග විග්‍රහ කිරීමයි. ශ්‍රී ලංකාවට පසුගිය වසර 50 තුළ ආර්ථික වශයෙන් ඉතා ධනාත්මක පසුතලයක සිටීමට හැකිවීමට හේතු ගණනාවක් තිබුණි. එම පසුතලය ධනාත්මක වුවද ඒ ගැන සෑහීමකට පත්ව සිටීමට අප ඉඩක් නැත. එහි වාසි ලබා ගැනීමට නම් අපට බොහෝ දේ කළ යුතුව තිබේ. නව සංවර්ධන ප්‍රතිපත්ති මාවතකට පිවිසීමේ දැඩි අවශ්‍යතාවයක් අද තිබේ.

1950 දශකයේ සිට වසර 25ක පමණ කාල පරිච්ඡේදයක් තුළ ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ රටාව ශීඝ්‍ර පරිවර්තනයකට ලක් විය. ආරම්භයේදී අප විදේශ විනිමය සඳහා තේ, රබර් සහ පොල් යන සාම්ප්‍රදායික වගාවන් කෙරෙහිම රැඳී සිටි අතර ඒවායේ මිල, ලෝක වෙළෙඳපොළේ ක්‍රමානුකූලව පහළ වැටීම නිසා ආර්ථික අර්බුදවලට මුහුණ දීමට අපට සිදුවිය.

1982 ලෝක බැංකු වාර්තාවේ සඳහන් වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භාණ්ඩ තුනේ මිල පහළ වැටීම, එරටේ ආර්ථිකයට තදින් බලපා ඇති බවය. අපගේ අපනයනයන්ගේ මිල පහළ වැටෙන අතරම රටේ ජනගහනය ද ක්‍රමානුකූලව වර්ධනය විය. එම වර්ධනය රටේ ආර්ථික වර්ධනයේ වර්ධන වේගයට වඩා වැඩි විය.

මීට අමතරව දේශීය සීමාවන්ට කොටු වූ ආර්ථික ප්‍රතිපත්ති නිසා ශ්‍රී ලංකා ආර්ථිකය නව දිශාවන්ට යොමු වීමේ මාර්ග ද අවහිර විය. 1978 දී අප ආර්ථිකය විවෘත කළ නමුත් එහි ඵල නෙළා ගැනීමට පෙර ජනවාර්ගික

අර්බුදයක් ඇති විය. එය රටේ ආර්ථිකයේ පසුබෑමකට හේතු විය. අද එවැනි අර්බුද වාතාවරණයක් නොමැත. එමෙන්ම ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම අප ආර්ථිකයට අද විශාල රුකුලකි. අද ලොව ශීඝ්‍රයෙන් වර්ධනය වන මහාද්වීපය වන ආසියාවේ රටක් වීමට අමතරව ඉන්දියානු සාගරය මධ්‍යයේ පිහිටා තිබීමත්, සුවිශාල ඉන්දියානු උප මහාද්වීපයට ආසන්නයේ සිටීමත්, ආසියාවේ ආර්ථික බලවතුන් වන චීනය, ජපානය, දකුණු කොරියාව, සිංගප්පූරුව සමග ඉතාමත් යහපත් ආර්ථික සබඳතා තිබීමත්, අපට වාසි සහගතය. ඒ අතරම අපේ සාම්ප්‍රදායික අපනයන වෙළෙඳපොළවල් වන බටහිර සමග ද අප හොඳ වෙළෙඳ සබඳතා පවත්වා ගෙන ඇත්තෙමු. එනමුත් බටහිර දැන් පසුබෑමකට ලක්ව තිබේ.

අපට ශක්තිමත් ද්විපාර්ශ්වික සබඳතා තිබෙන අතර විදේශයන් සමග ගනුදෙනු කිරීමේදී යම් සමබරතාවයක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවක් තිබේ. එය යහපත් තානාපති සබඳතා තුළින් කර ගත හැක. අපේ භූගෝලීය පිහිටීමෙන් වාසි ලැබීමට ඇති ඉඩකඩ බොහෝය. ආර්ථික වශයෙන් අපට අභියෝගයක් පවතින්නේ ලෝක ආර්ථිකයේ මෙම යුගයේ පවතින ක්‍රමානුකූල පසුබෑසීමය.

1980, 1990 දශකවලදී ලෝක ආර්ථිකයේ විශාල වර්ධනයක් දක්නට ලැබුණි. අද එහි මන්දගාමී බවක් දක්නට ලැබේ. කෙසේවුවද ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමේ වාසිය සහ අද පවතින යහපත් ජාත්‍යන්තර සබඳතා තුළින් මෙම අභියෝගවලට මුහුණ දීමට හැකියාවක් තිබේ.

අද රටට නව ආර්ථික දැක්මක් අවශ්‍යය ය. එහි ජාත්‍යන්තර සමාජ සංවර්ධනය ද අනෙක් අතට ආර්ථික වර්ධනය පවත්වා ගැනීමේ අවශ්‍යතාවයක් ද තිබේ. ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දර්ශක ගැන අපට සෑහීමකට පත්විය හැක. එසේම ජාත්‍යන්තර සහශ්‍ර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට සමත්වීමේ අනුපාතය අතින් ශ්‍රී ලංකාව බොහෝ රටවලට වඩා ඉදිරියෙන් සිටී. එහෙත් 1948 දී නිදහස ලබන විට මුළු ආසියාවෙන්ම ශ්‍රී ලංකාව සමාජ ආර්ථික දර්ශකයේ දෙවෙනි වූයේ ජපානයට පමණකි. 1965 දී අපි දකුණු කොරියාවටත් වඩා ඉදිරියෙන් සිටියෙමු. එහෙත් දැන් තත්ත්වය එසේ නොවේ. එදා ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර ද වැඩි වෙනසක් තිබුණේ නැත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



1965 දී ඒක පුද්ගල ආදායම අතින් අප හා සම තත්ත්වයේ සිටි සිංගප්පූරුව සහ දකුණු කොරියාව අද අපිට වඩා බොහෝ ඉදිරියෙන් සිටී.

මා යම් නිදර්ශන ගෙන හැර පෑවේ ඔබ සැම කලකිරීමට පත් කිරීමට නොවේ. ශ්‍රී ලංකාව ලොව බොහෝ රටවලට වඩා ඉදිරියෙන් සිටී. එහෙත් අප සිටිය යුත්තේ ඉදිරියෙන්ම සිටින රටවල් සමගය. ශ්‍රී ලංකාව ආසියාවේ දිදුලන ආලෝකයක් බවට පත් විය යුතුය. සමාජ සංවර්ධනය සහ ආර්ථික ප්‍රගතිය අතර හොඳ සමතුලිතතාවයක් ඇති කර ගැනීම සඳහා අපට ලබා ගත හැකි පාඩම් මොනවාද?

සමාජ සංවර්ධනය තුළින් රටකට ආර්ථික අභියෝග ජය ගැනීමේ ශක්තිය ලැබේ. යුද අර්බුද පැවති කාලයේ පවා ශ්‍රී ලංකාව 5% ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීමට සමත් විය. එසේ කළ හැකි වූයේ අපගේ ශක්තිමත් සමාජ සංවර්ධන පදනම නිසාය. ඒ අතරම සමාජ සංවර්ධනයෙන් පමණක් රටකට සෑහීමකට පත්විය නොහැක.

අපට තරුණ ශ්‍රම බලකායේ ඉල්ලීම් සපුරාලීමට හැකියාවක් නොවීය. එබැවින් දකුණේ තරුණ කැරලි දෙකකට, මුහුණ පෑමට සිදුවිය. උතුරේ අවි ගත් සටනක් ද ඇති විය. තරුණ අපේක්ෂාවන් ඉටුකළ නොහැකි වූ විට ඒවා ආයුධ සන්නද්ධ ගැටුම් බවට පරිවර්තනය විය. එබැවින් තරුණ අපේක්ෂාවන් සපුරාලීමට හැකි ආර්ථික වාතාවරණයක් ගොඩනැගීමට නම් අවම වශයෙන් 8% ක වාර්ෂික ආර්ථික වර්ධනයක් ලැබිය යුතුය. එවිට සමාජ, දේශපාලන ස්ථාවරත්වයක් ඇති කර ගත හැක. මැලේසියාවේ ද විවිධාංගික ජන සංයුතිය පිළිබඳ අර්බුද පැවති නමුත් එම අභියෝග පාලනය කර ගත හැකි වූයේ අවුරුදු 15 ක් ම 8% ක ආර්ථික වර්ධනයක් ලබා ගත හැකි වූ බැවිනි. එම ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභවලින් ජනතාවගේ අපේක්ෂාවන් සපුරාලමින් දේශපාලන ස්ථාවරත්වය ඇති කර ගැනීමට මැලේසියාවට හැකි විය. ඒකාකාරී ආර්ථික ප්‍රතිපත්තියකින් ඉදිරියට යායුතු වීමට තවත් හේතුවක් වන්නේ අප මැදි ආදායම්ලාභී රටක් ලෙස ඉහළ තලයකට පිවිස ඇති බැවිනි.

මැදි ආදායම්ලාභී රටකට අයවැය හිඟය පියවීම සඳහා ජාත්‍යන්තර සහාය ලබාගැනීම දුෂ්කරය. අපට ආදායම ඉක්මවා වියදම් කළ නොහැක. දැන් අපේ ආදායමට වඩා වියදම වැඩි නිසා හිඟය පියවීමට විදේශ ණය

ලබාගැනීමට සිදුව ඇත. අපට අඩු පොලියට ණය ලබා ගත හැකි වන්නේ ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ ආර්ථික දර්ශකවල අප යහපත් මට්ටමක සිටියහොත් පමණි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දැඩි කොන්දේසි පනවනවා යැයි ඔබ සිතනවා විය හැක. එහෙත් ණය දෙන විවෘත මූල්‍ය ආයතනවල කොන්දේසි සහ පොළිය ඊට වඩා අධිකය.

ශ්‍රී ලංකාව පසුගිය දශක කිහිපය තිස්සේ ආදායමට වඩා වියදම් කිරීමට සමත් වූයේ කෙසේ දැයි ඔබ ප්‍රශ්න කළ හැක. එසේ කළ හැකි වූයේ මේ රටේ ලිබරල් ආර්ථික පසුබිම නිසා මේ රට ණය දෙන රටවල ප්‍රසන්න ගිණුම්කරුවෙකු බවට පත් වීමය. ණය දෙන රටවල් සංවර්ධන කටයුතු සඳහා බොහෝ පහසු කොන්දේසි මත ණය දීම නිසා අපගේ ණය බර ක්‍රමයෙන් වර්ධනය විය. අපට ලැබුණු ණයවලින් තුනෙන් දෙකක්ම ලැබුණේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙනි. එසේ 1% කට අඩු පොලියට ණය ලැබුණු නිසා අපි සංවර්ධනයට අවශ්‍ය දැඩි තීරණ ගැනීමෙන් වැළකී එක්තරා දුරකට සෑහීමකට පත්ව සිටීම නිසා ආර්ථික අර්බුද වැඩි විය. අද අප පත්ව සිටින්නේ විදේශීය ණය දෙන්නන්ගේ දැඩි කොන්දේසි උඩ පවා ණය ලබා ගත යුතු තත්ත්වයකටය. අපි නිවැරදි ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය නොකළ හොත් අපට ලෝක මූල්‍ය සමාගම්වල කොන්දේසිවලට අවනත වීමට සිදුවේ. අප ආර්ථික අවපාතයකට ලක්ව නැති නමුත් අප අද පසුවන්නේ දුෂ්කර අවදියකය. එබැවින් අපි අපේ හැකියාවන් මතම දිරිගැන්වීමට ඉගෙන ගත යුතුය. අපි අපේ ඵලදායකත්වය වැඩි කර ගත යුතුය.

## සහන ඉල්ලීම වෙනුවට පුද්ගල ඵලදායකත්වය ඉහළ නැංවිය යුතුය

අප බොහෝ දෙනා පුරුදු වී සිටින්නේ සහන ඉල්ලීමටය. සෑම ප්‍රශ්නයකදීම විසඳුම සඳහා සහන ඉල්ලීම සිරිතක් වී ඇත. ඒ වෙනුවට අප ඵලදායකත්වය වැඩි කර ගත යුතුය. අපගේ ආර්ථික මනස සහ සංස්කෘතිය වෙනස් කළ යුතුය. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය දෙසට වේගයෙන් ගමන් කළ යුතුව ඇත. අපට ඇති තවත් අභියෝගයක් වන්නේ ජන සංයුතියේ පරිවර්තනය යි. දැන් ක්‍රමයෙන් වැඩිහිටි ජනසංඛ්‍යාව වර්ධනය වෙමින් තිබේ. වැඩකරන

ජනතාවගේ ප්‍රතිශතය උපරිම මට්ටමක පවත්නා විට ආර්ථික වර්ධනය වේගවත් වේ. ශ්‍රී ලංකාව දැන් එම උපරිම මට්ටම පසුකර වැඩකරන ජනතාවගේ ප්‍රතිශතය අඩු වෙන දිශාවට ගමන් කරමින් සිටී. යුද සමයේදී පවා අපේ ආර්ථික වර්ධනය වේගවත් වූයේ එම කාලයේ ශ්‍රම බලකායේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවති බැවිනි. අපේ වැඩිහිටි සංඛ්‍යාව ඉහළ නැග තිබේ. එබැවින් ශ්‍රම බලකායේ සංඛ්‍යාව ගැන බලාපොරොත්තු නොතබා පුද්ගල ඵලදායකත්වය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවයක් අද තිබේ.

මෙම යථාර්ථය තේරුම් ගෙන නව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කර ගත යුතුය. අර්බුද අවසන් වීමෙන් පසු විශාල ණය ලබා ගැනීම තුළින් යටිතල පහසුකම් දියුණු කිරීමට පියවර ගැනුණි. අපගේ ණය ප්‍රතිශතය වෙන බොහෝ රටවලට වඩා දෙගුණයකින් වැඩිය. අපගේ සෑම රුපියලකින්ම ශත 91 ක් ණය සහ සේවාවන් සඳහා යෙදවූ විට සංවර්ධනය සඳහා ඉතුරු වන්නේ කුමක්ද? එසේ වුවද ඉදිරි වසර පහ හය තුළද අපට විශාල වශයෙන් ණය ලබා ගැනීමට සිදුවේ. පරණ ණය ආපසු ගෙවීම සඳහාත් අනිකුත් සංවර්ධන අවස්ථාවන් සඳහාත් අලුතින් ණය ලබා ගැනීමට සිදුවේ. දිගටම ණය මත නොරැඳී විකල්ප ආර්ථික හා නිෂ්පාදන ප්‍රතිපත්තියක් වෙත යා යුතුව තිබේ. අපි ගෝලීය මූල්‍ය සම්පත් සඳහා පිවිසිය යුත්තේ මූල්‍ය අරමුදලේ වැඩසටහන් තුළිනි. දිගටම ණය මතම යැපුණහොත් අප අපගේ මීළඟ පරම්පරාවට ලබා දෙන්නේ කුමක්ද? ආර්ථික ප්‍රතිපත්ති සමගම අපගේ නිෂ්පාදන ප්‍රතිපත්ති ද වෙනස් කළ යුතුව ඇත. 8% ක හෝ 10% ක ආර්ථික වර්ධනයක් ලැබීමට නම් අපේ නිෂ්පාදන මතම බලාපොරොත්තු තැබීමෙන් එය කළ නොහැක. නව සංවර්ධන සැලැස්ම විය යුත්තේ සහ ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ ආර්ථික දැක්ම වන්නේ සියලුදෙනාටම සම අවස්ථාවන් ලැබෙන තිරසර සංවර්ධනයක් සහතික කිරීමට සමත් තරගකාරී සමාජ ආර්ථිකයක් ගොඩනැගීමය.

ඒ සඳහා ඔබ සියලු දෙනාටම වැදගත් මෙහෙයක් භාර වේ. ඒ සඳහා ප්‍රධාන වගකීම ඇත්තේ රාජ්‍ය සේවයේ භාරධූර වගකීම් දරන ඔබ සැමටය. මෙය කාර්යක්ෂමව කළ යුතුය. රාජ්‍ය සේවය සමාජයේ සෑම කොටසකටම අදාළ වන පරිදි මෙම ආර්ථික පිළිවෙත කාර්යක්ෂමව සහ තරගකාරී ලෙස කිරීමේ වගකීම ඔබ සතුය.

## විදේශ ආයෝජන කෙරෙන නිෂ්පාදන මුළුමනින්ම අපනයනය කළ යුතුව තිබේ

යටිතල පහසුකම්, ප්‍රවාහන, සන්නිවේදන ආදී ක්ෂේත්‍රයන් අත්‍යවශ්‍ය බව ඇත්තය. එහෙත් එවැනි ක්ෂේත්‍රයන් සඳහා ආයෝජනය කිරීමෙන් පමණක් 10% ක වර්ධන වේගයක් ලබා ගැනීමේ හැකියාවක් නොමැත. ඒ සඳහා අපට ආදර්ශයට ගත හැක්කේ අග්නිදිග ආසියානු රටවල්ය. එම රටවල් ආර්ථික වශයෙන් 10% ක වර්ධනයක් ලැබුවේ විදේශ ආයෝජන මගින් කෙරෙන නිෂ්පාදනයන් මුළුමනින්ම අපනයනය කිරීම තුළිනි. අපට අපේ රටේ පුද්ගලික අංශය වර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් තිබේ. රාජ්‍ය අංශයට එවන් වර්ධන වේගයක් සඳහා දායක විය නොහැක්කේ අයවැය පරතරය අධික වීමත් ණය බර වැඩි වී තිබීමත් නිසාය. පුද්ගලික අංශයේත් විදේශීය ආයෝජන තුළිනුත් අපනයනය වර්ධනය කර ගැනීමෙන් අපට ආර්ථික වර්ධන වේගය සීඝ්‍රයෙන් ඉහළ නැංවීමේ හැකියාවක් තිබේ. විශාල රටක් වන චීනය පමණක් නොව කුඩා රටක් වන සිංගප්පූරුව ද ශීඝ්‍ර වර්ධනයක් ලැබුවේ ආයෝජන තුළින් අපනයනය වැඩි කිරීමෙනි.

## ගෝලීය සැපයුම් පද්ධතියේ පුරුකක් ලෙස ශ්‍රී ලංකාව සම්බන්ධ කිරීම

අප පසුබෑමට ලක් වූයේ අපනයනයන් ක්‍රමයෙන් ඉහළ නගිනවා වෙනුවට පහළ වැටුන නිසාය. දළ ජාතික ආදායමෙන් අපනයන ආදායම් ප්‍රතිශතය 20% දක්වා පහළ වැටී ඇත. මැලේසියාව, තායිලන්තය සහ වියට්නාමය වැනි රටවල අපනයන ආදායම දළ ජාතික ආදායමෙන් 70% දක්වා ඉහළ ගොස් තිබේ. අපේ භූගෝලීය පිහිටීම නිසා අප කලාපීය සැපයුම් මාර්ගවලට අවතීර්ණ වී එමගින් ගෝලීය සැපයුම් පද්ධතියේ වැදගත් පුරුකක් බවට පත් විය යුතුය. අප චීනයේ සැපයුම් සේද මාවතේ වැදගත් ස්ථානයක පිහිටා සිටී. ඉන්දියාවේ අසල්වැසියෙක් වන අපට අගමැති මෝදිගේ "ඉන්දියාවේ නිපදවමු" නම් යෝධ ආර්ථික සැලසුමේ කොටස්කරුවෙකු වීමට හැකියාවක් තිබේ.

මේ වර්ධන වේගය පවත්වා ගැනීමට නම් එය කළ හැකි වන්නේ අපනයනයන් වැඩිකිරීමෙන් පමණකි. අප රටේ මිලියන 21 ක ජනගහනයක නිෂ්පාදන ක්ෂේත්‍රයන්ගෙන් පමණක් එය කළ නොහැකියි.

## 8% ක වර්ධන සඳහා දළ ජාතික නිෂ්පාදනයෙන් 30% අපනයන නිෂ්පාදන සඳහා ආයෝජනය කළ යුතුව තිබේ

8% ක වාර්ෂික වර්ධනයක් පවත්වා ගැනීමට නම් දළ ජාතික ආදායමින් 30% ක් වත් අපනයන නිෂ්පාදන සඳහා වැය කළ යුතුය. එසේ කිරීමේ හැකියාවක් අපට කිසිසේතම නොමැති බැවින් අපට විදේශීය ආයෝජන අත්‍යවශ්‍ය වේ. ආනයන හිඟය පියවීමට ණය ගැනීමේ ප්‍රතිපත්තිය තව දුරටත් ඉදිරියට ගෙන යා නොහැක. ණය වැඩි නොවන ලෙස මූල්‍ය පහසුකම් ලබා ගත හැකි වන්නේ විදේශීය ආයෝජන තුළිනි.

## දැනට ඩොලර් බිලියනයක්ව තිබෙන විදේශ ආයෝජන ඩොලර් බිලියන 05 දක්වා ඉහළ දමාගත යුතුය

විදේශ ආයෝජනවලින් අපට ලැබෙන්නේ මූල්‍ය පහසුකම් පමණක් නොවේ. එතුළින් අපට නව තාක්ෂණය, නව වෙළෙඳපොළවල්, විශේෂඥ ඥානය පමණක් නොව සුප්‍රකට වෙළෙඳ නාම ද ලබාගත හැකියි. අපේ රටේ මේ වසරේ විදේශ ආයෝජන ප්‍රමාණය දැනට ඩොලර් බිලියනයකි. මැලේසියාව, තායිලන්තය, වියට්නාමය වැනි රටවල් වසරකට අප මෙන් තෙගුණයක් විදේශ ආයෝජන ලබා ගනී. අපි ඉදිරියේදී වසරකට ඩොලර් බිලියන පහ බැගින් ආයෝජන ලබා ගත යුතුව ඇත.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ද කෘෂිකර්මාන්තයේ ඵලදායකත්වය ද ඉහළ දැමිය යුතුය

එසේම දේශීය හැකියාවන් වර්ධනය කළ යුතුයි. ඒ සඳහා මාර්ගය, සහන දීම නොවේ. අප ආයෝජන වැඩි කළ යුත්තේ අධ්‍යාපනය, තාක්ෂණ දියුණුව, තාක්ෂණ ශිල්පීය පුහුණුව, ශ්‍රම බල හැකියාවන් වර්ධනය කිරීම තුළින් දේශීය ශ්‍රමිකයින් නංවාලීමටයි. ඒ සමගම සංවර්ධන සැලසුමට අයත් විය යුත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පුළුල් කිරීම සහ කෘෂිකර්මාන්තයේ ඵලදායකත්වය වැඩිකිරීමට ගත යුතු පියවරයි.

## ජනතා සුබසාධනය හා සංවර්ධනය එකවර

ජනතා සුබසෙත හා සංවර්ධනය එකවර කළ නොහැකි බව සමහරු කියති. එහෙත් චීනය වසර ගණනාවක් තිස්සේ සියයට 10 ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගන්නා අතරම මිලියන 300 ක ජනගහනයක් දරිද්‍රතාවයෙන් ඉහළ මට්ටමකට ගෙන ඒමට ද සමත්විය.

රටේ වර්ධනය වේගවත් වන විට රජයට බදු අයකර ගැනීමේ හැකියාව ද වැඩිවේ. බදු ආදායම වැඩි වූ විට සමාජයේ දුප්පත්ම කොටස්වලට වැඩිපුර සහන සැලසීමේ හැකියාවක් තිබේ. ඉන්දියාවේ ග්‍රාමීය ජනතාවට රැකියා සහතික කිරීමේ මහත්මා ගාන්ධි ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර තිබීම, ඒ සඳහා උදාහරණ වේ. එය කළ හැකි වූයේ ඉන්දියාවේ වර්ධන වේගය වැඩි වූ නිසාය. බ්‍රසීලයේ ද එබදු සුබසාධන වැඩසටහන් තිබේ.

රටක වර්ධනය වේගවත් කරන අතරම දිළිඳු ජනතාවගේ සුබසෙත සඳහා ද ක්‍රමවත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. එහෙත් එය කළ යුත්තේ සහන තුළින් නොව එම ජන කොටස්වල ආදායම් ඉපයීමේ හැකියාව නංවාලීමෙනි. පරිසරය සුරැකීම ද තවත් අත්‍යාවශ්‍ය කාරණයකි. සංවර්ධනය සඳහා සැලසුම් සියල්ල ක්‍රියාත්මක කළ යුතු වන්නේ පරිසරය සුරැකෙන අයුරිනි.

## වියදම, ආදායමට වඩා වැඩි වූ විට සිදුවන්නේ කුමක්ද ?

රටක කාන්තා රැකියා ප්‍රතිශතය නැංවීම ද අත්‍යවශ්‍ය කරුණකි. එමෙන්ම රටක වර්ධනයට ද සෑම කලාපයකටම සම ලෙස බෙදී යා යුතුයි. 1987 පටන් ශ්‍රී ලංකාවේ ආදායමට වඩා වියදම සෑම වසරකම අධික විය. එබැවින් සෑම වසරකදීම අයවැය ශේෂය වැඩිවිය. එය පියවූයේ ණය ලබාගැනීමෙනි. ඔබ සිතා බලන්න ඔබේ ගෙදර වියදම 1987 සිට සෑම වසරකදීම ආදායමට වඩා වැව් වූ විට ඔබට සිදුවන්නේ කුමක්ද.

## ගොවියා ඵලදායක නිෂ්පාදකයෙකු බවට පත් කළ යුතුය

සංවර්ධනය සඳහා ණය ලබාගැනීමට සිදුවන බව ඇත්තකි. එහෙත් ආදායම් වියදම් පරතරය පියවීමට ණය ලබා ගැනීම ඵලදායක නොවේ. අපේ රටේ

ඵලදායකත්වය අඩුම ක්ෂේත්‍ර තුන වන කෘෂිකර්මය, රජය සතු සමාගම් සහ රාජ්‍ය සේවය සඳහා භාණ්ඩාගාරයෙන් අති විශාල මුදලක් වැයවේ. එහි ඵලදායකත්වය වැඩි නොකර ආර්ථිකය වර්ධනය කළ නොහැකිය. කෘෂිකර්මය සඳහා දළ ජාතික ආදායමින් 20% ක් වැයකරන අතර ඒ සඳහා අපේ ශ්‍රම බළකායෙන් 28% ක් ශ්‍රමය සපයති. එහෙත් ලැබෙන ප්‍රතිලාභය සියයට 8 ක් පමණි. ඒ නිසා අපේ ගොවියා ඵලදායකත්වය අඩු උගුලෙන් බේරා ගත යුතුයි.

කෘෂිකර්මය විශාල ඉඩම් හිමියන්ට පවරා විශාල ආදායම් ලබාගැනීමේ පිළිවෙතකට අප යා යුතු යැයි මා අදහස් කරන්නේ නැහැ. එහෙත් කෘෂිකර්ම ඵලදායකත්වය නංවාලීම අත්‍යවශ්‍ය කරුණකි. අපේ ජනතාවගෙන් තුනෙන් එකක් රුපියල් 350 ක දෛනික ආදායමක් මත ජීවත්වන්නේ නම් ඔවුන් ඉහළ තලයකට ගෙන ඒමට වැඩි අවධානයක් දැක්විය යුතු නොවන්නේද. දරිද්‍රතාවය 8% ක් වන නමුත් 32% ක් ජීවත්වන්නේ රුපියල් 350 ක් වූ දෛනික ආදායමක් මතයි. එයින් වැඩි කොටසක් කෘෂිකර්මාන්තය මත රදා පවතියි. කෘෂිකර්මය වැදගත් නමුත් නූතන ක්‍රමය වෙනස් නොකර මේ තත්ත්වය ඉදිරියට ගෙන යාමට ආර්ථිකයට ශක්තියක් නොමැත. තෙත් කලාපයේ වී වගාවෙන් අතිරික්තයක් තිබෙන බැවින් වගා ක්‍රමය වෙනස්කර වී වෙනුවට වැඩි ආදායමක් ලැබෙන බෝග වගා කිරීමේ ක්‍රමවේදයක් සොයා බැලිය යුතුව ඇත. ඵලදායකත්වය වැඩි කිරීම සඳහා එවැනි ක්‍රමවේදයන් තිබේ.

## රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරීම එහි ඵලදායකත්වය ඉහළ දැමීමේ ක්‍රමවේදයක්

රජයට අයත් ව්‍යාපාරයන් කෙරෙහි තව දුරටත් බලා සිටිය නොහැකියි. පුද්ගලීකරණය ඒ සඳහා එක් විසඳුමකි. එසේ කළ නොහැකි නම් ඵලදායකත්වය වැඩි කිරීමට වෙනත් පියවර ගත යුතුව ඇත. ඵලදායකත්වය පහළට වැටී ඇති අනෙක් ක්ෂේත්‍රය රාජ්‍ය සේවයයි. රාජ්‍ය සේවය දැඩි ආකර්ෂණයට ලක්වීම ස්වභාවිකය. රැකියා සුරක්ෂිත භාවය, විශ්‍රාම වැටුප ආදී නොයෙක් හේතූන් ඒ සඳහා තිබේ. රාජ්‍ය සේවයේ සංඛ්‍යාව අඩු කිරීමට හැකියාව නොමැති නම් අවම වශයෙන් රාජ්‍ය සේවයට තව දුරටත් බඳවා නොගෙන මේ මට්ටමින් පවත්වාගෙන යා යුතුයි. එහෙත් කොතරම් දුරට අපිට හැකියාව තිබේද මේ තරම් සංඛ්‍යාවකට දිගටම විශ්‍රාම වැටුප්

ගෙවීමට?. ඵලදායකත්වය වැඩි කිරීම සඳහා පුහුණු ක්ෂේත්‍රයන් සඳහා වැඩි ආයෝජනයන් කළ යුතුයි. මැලේසියාව, වියට්නාමය, තායිලන්තය වැනි රටවලට වඩා ශ්‍රී ලංකාවේ ශ්‍රම වේතන වැඩිය. එහෙත් ඵලදායකත්වය අඩුය. මේ තත්ත්වය යටතේ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම පහසු නොවේ. එබැවින් ජාතික ආර්ථික පිළිවෙතක් හරහා හැකියාවන් වර්ධනය කිරීමට පියවර ගැනීම අත්‍යවශ්‍යයි.

## වෙළඳ ගිවිසුම් අපගේ සංවර්ධනයේ මූලෝපායක් ලෙස

අනෙක් වැදගත් ක්ෂේත්‍රය නම් වෙළෙඳ ගිවිසුම්ය. ඉදිරි වසර තුළදී ශ්‍රී ලංකාව චීනය සමග නව වෙළෙඳ ගිවිසුමක් ඇතිකර ගැනීමට ද ඉන්දියාව සමග ගිවිසුම නවීකරණය කිරීමට ද සිංගප්පූරුව සමග වෙළෙඳ ගිවිසුමක් ඇති කර ගැනීමට ද පකිස්ථානය සමග ඇති වෙළෙඳ ගිවිසුම පුළුල් කර ගැනීමට ද පියවර ගනු ලැබේ. එමෙන්ම යුරෝපයේ ධීවර වෙළෙඳ සහනය මේ වසරේ අපට ලැබීමට නියමිතය.


මේ ගිවිසුම් අනුව ශ්‍රී ලංකාවට බිලියන 03 ක ජනගහනයක් සහිත විශාල වෙළෙඳ පොළක් බදු සහන යටතේ විවෘත වේ. එය අපිට විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ඇති හොඳම අවස්ථාව වේ.

මෙය කියන තරම් පහසුවෙන් දිනාගත හැකි ජයග්‍රහණයක් නොවේ. එහෙත් කැපවීමෙන් කටයුතු කිරීමෙන් මේ අරමුණ ඉටුකරගත හැකියි. අද ඇති වාසි සහගත තත්ත්වයෙන් උපරිම ඵල නෙළා ගැනීමට අපි උත්සුකව ක්‍රියාකළ යුතුයි.

ජනාධිපති ලේකම් කාර්යාලය
25 AUG 2023
පුස්තකාලය

- ජනාධිපති මාධ්‍ය අංශය -

2016 - 07 - 22


ශ්‍රී ලංකා